අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය - 2024

අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ (AIUDP) 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හා සංවර්ධනය සඳහා වන ප්‍රංශ නියෝජිතායතනය අතර 2016 දෙසැම්බර් 01 දින එළඹි (2017 අගෝස්තු 31, 2018 මැයි 14 හා 2021 මාර්තු 14 යන දිනයන්ගෙන් සංශෝධිත) CLK – 100901 R අංක දරන ණය ගිවිසුමේ 3.4.3 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව

ණය පහසුකම් ගිවිසුම අනුව, නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර එය නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහන (SCDP) යටතේ ක්‍රියාත්මක වේ.

අනුරාධපුර නගරයේ පූජනීය සහ නූතන කොටස අතර සමතුලිත සම-සංවර්ධන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම සහ එහි සංස්කෘතික හා ජාතික උරුමයන් ආරක්ෂා කිරීම හා මෙය ප්‍රධාන ආකර්ශනීය ස්ථානයක් බවට පත්කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ.

ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 9,779.95 කට සමාන යූරෝ මිලියන 62.4 ක් වන අතර ඉන් රු.මිලියන 8,149.96 කට සමාන යූරෝ මිලියන 52ක් සැපයීමට සංවර්ධනය සඳහා වන ප්‍රංශ නියෝජිතායතනය එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 1,629.99 ක මුදල ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ.

ව්‍යාපෘතියේ කටයුතු 2016 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර, 2021 දෙසැම්බර් 31 දින වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, සංශෝධිත ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2023 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි. පසුව ව්‍යාපෘතිය 2025 මාර්තු 31 දක්වා තවදුරටත් දීර්ඝ කිරීමට කැබිනට් තීරණයක් ගන්නා ලදී.

1.3 මතය

2024 දෙසැම්බර් 31 දිනට අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.1 ගිණුම්කරණ අඩුපාඩු

ගිණුම්කරණ අඩුපාඩුව/ විගණන නිරික්ෂණය	කළමනාකරණයේ ප්‍රතිචාරය	විගණකගේ නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට සංවර්ධනය සඳහා වන ප්‍රංශ නියෝජිතායතනය (AFD) වෙතින් ලබාගත් ණය පහසුකම ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කර නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වෙන ණය ශේෂය සහ සංවර්ධන වියදම් ශේෂය අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි.	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අංක 03/2024 ට අනුව, ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල විනිමය අනුපාත වෙනස්කම් ගැලපීම අවශ්‍ය නොවේ.	2024 දෙසැම්බර් 31 දිනට ණය මුදල ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කළ යුතුය.

2.2 නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්

	සංරචකය / උප සංරචකය	නීතිරීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම / විගණන නිරික්ෂණය	කළමනාකරණයේ ප්‍රතිචාරය	විගණකගේ නිර්දේශය
(අ)	අනුරාධපුර දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීම	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 ඡේදය	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.13.4 වගන්තියට අනුව, තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශයන්ට යටත්ව, ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට ඇස්තමේන්තුගත වටිනාකමෙන් සියයට	තාක්ෂණික ඇගයීම් කමිටුව සහ අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව	ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ට අනුව එවැනි වැඩ ක්‍රියාත්මක කිරීමට පෙර

			10 ක් දක්වා ශුද්ධ මිල විචලනයක් අනුමත කළ හැකිය. නමුත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනිව සුදුසු ප්‍රසම්පාදන කමිටු සහ තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතිය ලබා නොගෙන, ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් වැඩ අනුමත කර ක්‍රියාත්මක කර ඇස්තමේන්තුගත වටිනාකමෙන් සියයට 23 ක් වන රු. මිලියන 196 ක් වටිනා විචලතා නියෝග 29 ක් සඳහා ගෙවීම් ද සිදු කර තිබුණි.	විසින් 1-30 දක්වා විචලනයන් නිර්දේශ කර ඇති අතර එය 2023 දෙසැම්බර් 29 දින අනුමත කරන ලදී.	පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ එළිමහන් රංග ශාලාව ප්‍රතිසංස්කරණය	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 ඡේදය	එළිමහන් රඟහලේ වහල ඉදිකිරීම සඳහා රු. මිලියන 31.91 ක් වැය කර තිබුණි. ව්‍යාපෘතියේ විෂයපථය වෙනස් කිරීම හේතුවෙන් වහල සැකසීමේ කටයුතු සඳහා ඇස්තමේන්තුගත මුදලට වඩා සියයට 664 ක් වැයකිරීමට සිදුව තිබුණු බව නිරීක්ෂණය විය. වෙළඳපලේ පැවති අමුද්‍රව්‍යය හිඟය හා රජරට සේවය විසින් රංග ශාලාවේ වහලය සැකසීමට යොදා ගනු ලබන තහඩු වෙනස් කර දෙන මෙන් කරන ලද ඉල්ලීම ඊට හේතු වී තිබුණි. කෙසේ වෙතත් ඒ සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි.	පිළිතුර ඉදිරියේදී ඉදිරිපත් කරනු ලැබේ.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය.

3. භෞතික කාර්යසාධනය

3.1 ව්‍යාපෘතියේ කටයුතු පිලිබඳ භෞතික ප්‍රගතිය

	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ ප්‍රතිචාරය	විගණකගේ නිර්දේශය
(අ)	2024 ඔක්තෝබර් 24 වන දින ජාතික මෙහෙයුම් මැදිරියේ (NOR) පැවති සාකච්ඡාවට අනුව 2025 මාර්තු 31 වන දින නිම කිරීමට නියමිතව තිබූ මෙම ව්‍යාපෘතියේ කටයුතු 2025 පොසොන් උත්සවයට පෙර අවසන් කිරීමට තීරණය කළද,	අදහස් ලබා දී නොමැත.	ව්‍යාපෘති කාල සීමාව තුළ වැඩ නිම කිරීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග

	විගණිත දිනය වන 2024 දෙසැම්බර් 12 වන දින වන විට ව්‍යාපෘතියේ කටයුතු සියයට 53 ක භෞතික ප්‍රගතියක් සහිතව තවමත් සිදුවෙමින් පවතින බව නිරීක්ෂණය විය.		ගත යුතුය.
(ආ)	ව්‍යාපෘතිය යටතේ සිදුකිරීමට අපේක්ෂිත පැකේජ 12 න් රු. මිලියන 2,123.19 ක් වටිනා පැකේජ 05 ක් පමණක් ආරම්භ කර තිබූ අතර 2022 දෙසැම්බර් 31 දින වන විට අවසන් කර තිබුණේ පැකේජ 2 ක් පමණි. 2023 වර්ෂයේදී මාස 04 සිට 07 දක්වා ප්‍රමාදයකින් පසුව අංක 3 සහ 4 පැකේජ නිම කරන ලද අතර ඒ සඳහා ප්‍රධාන වශයෙන් දුර්වල ඉදිකිරීම් අධීක්ෂණය සහ සැලසුම් හා නිර්මාණ කිරීමේ දුර්වලතාවය බලපා තිබුණි.	අදහස් ලබා දී නොමැත.	ව්‍යාපෘති කාල සීමාව තුළ වැඩ නිම කිරීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඇ)	ණය පහසුකම් ගිවිසුමට අනුව 2021 අවසන් වන විට ව්‍යාපෘතියේ රු.මිලියන 6,562.68 ක් වටිනා පැකේජ 12 ක ප්‍රසම්පාදන සම්පූර්ණ කර තිබිය යුතු නමුත් රු. මිලියන 5,025ක් වටිනා පැකේජ 07 ක ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. තවද, ණය පහසුකම 2023 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබූ අතර ව්‍යාපෘතිය 2025 මාර්තු 31 දක්වා දීර්ඝ කිරීමට කැබිනට් තීරණයක් ගෙන තිබුණි. දුර්වල කාර්ය සාධනය හේතුවෙන් ව්‍යාපෘති කාල සීමාව තුළ නිම කිරීමට අපේක්ෂිත වැඩ කටයුතු දීර්ඝ කරන ලද ව්‍යාපෘති කාල සීමාව අවසන් වන විට සම්පූර්ණයෙන්ම අවසන් කල නොහැකි බව තවදුරටත් නිරීක්ෂණය විය.	මෙම විශේෂිත ව්‍යාපෘති දිගුව ලබා දී ඇත්තේ, විශේෂයෙන් දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීම ඇතුළුව, ප්‍රතිසාධන කටයුතු සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාව සඳහා පමණි. අමාත්‍යාංශය විසින් ඉතිරි වැඩ සාර්ථක ලෙස නිම කිරීම සඳහා එක් වසරක කාලදිගුවක් ලබා දෙන ලෙස කැබිනට් මණ්ඩලයෙන් ඉල්ලීමක් කර ඇත.	ව්‍යාපෘති කාල සීමාව තුළ ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

	සංරචකය / උප සංරචකය	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ ප්‍රතිචාරය	විගණකගේ නිර්දේශය
(අ)	අනුරාධපුර දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීම	අනුරාධපුර දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය 2022 පෙබරවාරි 24 වන දින ආරම්භ කරන ලද අතර 2023 නොවැම්බර් 25 වන දින එනම් මාස 21 ක් ඇතුළත නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. ප්‍රංශ නියෝජිතායතනයේ (AFD) සහ මහා භාණ්ඩාගාරයේ තීරණය ලැබෙන තුරු නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය ව්‍යාපෘතියේ කටයුතු නවතා දමා තිබුණි. (පාංශු සංරක්ෂණ කටයුතු සහ ජලාපවහන පද්ධතිය හැර) කෙසේ වෙතත්, දැනට ක්‍රියාත්මක කර ඇති සියලුම ව්‍යාපෘති NOR උපදෙස් සහ ණය දෙන ආයතනයේ කැමැත්ත ඇතිව ඉදිරියට ගෙන යාමට අමාත්‍ය මණ්ඩල තීරණයක් සමඟ අමාත්‍යාංශය එකඟ වී තිබුණි. ආරම්භ කරන ලද සියලුම උප ව්‍යාපෘති ශ්‍රී ලංකා රජයේ අරමුදල් මගින් සම්පූර්ණ කිරීමට එකඟ වී තිබුණි. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන අවසන් වන තෙක් ප්‍රංශ නියෝජිතායතනය මගින් යුරෝ මිලියන 6 ක් ප්‍රතිපූර්ණය කිරීමට එකඟවී තිබුණි. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.		
		(i) දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය සැලසුම් සහ උපදෙස් ලබා දීමට අපොහොසත් වීම හේතුවෙන් ව්‍යාපෘතියේ ප්‍රගතියේ ප්‍රමාදයන් ඇති බව කොන්ත්‍රාත්කරු අමාත්‍යාංශයට අඛණ්ඩව දැනුම් දී ඇති බව නිරීක්ෂණය විය. උපදේශන ආයතන 03කගේ සේවය ලබාගෙන තිබුණද ව්‍යාපෘතියට අදාල නිවැරදි සැලසුම් පිළියෙල නොකිරීම හා උපදේශන කාර්යය නිසිපරිදි සිදු නොවීම හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු මන්දගාමීව සිදුවන බව නිරීක්ෂණය විය.	මෙම විශේෂිත උපදේශන සේවාවන් අදියර කිහිපයක් සඳහා ලබාගෙන ඇති අතර එකම අරමුණක් සඳහා නොව අරමුණු කිහිපයක් සඳහා ලබාගෙන ඇත. මෙම ප්‍රසම්පාදන සඳහා කාලරාමුව ද වෙනස් වේ.	අදාළ සැලසුම් නියමිත වේලාවට ඉදිරිපත් කිරීමට පියවර ගත යුතු අතර උපදේශන කටයුතු සමීපව නිරීක්ෂණය කළ යුතුය.

		(ii) මෙම ව්‍යාපෘතියේ ටව් ඇන්ඩ් ගෝ බස් නැවතුම්පොළ ගොඩනැගිල්ලේ මීටර් 12 ක කොටසක් මාර්ග සංවර්ධන අධිකාරියේ පූර්ව අනුමැතිය ලබා නොගෙන, මාර්ග සීමාව උල්ලංඝනය කරමින් ප්‍රධාන මාර්ගයට ඉතා ආසන්නව ඉදිකර ඇති බව නිරීක්ෂණය විය.	මෙම කාරණය විමර්ශනය කිරීම සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයෙහි ලේකම්වරයා කමිටුවක් පත් කර ඇත. අමාත්‍යාංශය ඒ අනුව පියවර ගනු ඇත.	තම වගකීම් ඉටු කිරීමට අපොහොසත් වූ අයට එරෙහිව පියවර ගත යුතුය.
		(iii) අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ මූලික අරමුණ ඉටුකිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද උප ව්‍යාපෘති අතුරින් ප්‍රධානතම උප ව්‍යාපෘතිය වන මෙම අනුරාධපුර දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2025 මාර්තු 31 දින වන විට වැඩ නිම කිරීමට සැලසුම් කර තිබුණ ද 2024 දෙසැම්බර් 31 වන දින වන විටද පැවති සියයට 53ක ඌණ කාර්යසාධනය අනුව නියමිත දිනට වැඩ නිම කළ නොහැකි වන බව නිරීක්ෂණය විය. එබැවින් විගණිත දින වනවිට රු.මිලියන 561.46ක් පමණ වැයකර තිබුණු මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභ අනුරාධපුර ජනතාවට හා අනුරාධපුර පූජානගරය නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ට සැපයීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය.	අදහස් ලැබී නොතිබුණි.	නියමිත කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට පියවර ගත යුතුය.
(ආ)	ගුවන්විදුලි සංස්ථාවේ එළිමහන් රංග ශාලාව ප්‍රතිසංස්කරණය	ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ එළිමහන් රංග ශාලාව රු.මිලියන 163.96 ක වටිනාකමකින් නිම කර තිබුණි. පහත සඳහන් නිරීක්ෂනයන් කරනු ලැබේ.		
		(i) මූලික ඇස්තමේන්තුව මගින් රු.මිලියන 19.28 වෙන්කර ශාලාව වෙත විදුලි පහසුකම ලබා දීමට සැලසුම් කර තිබුණු අතර රු.මිලියන 10.43 ක් වැයකර විදුලි පරිපථ ස්ථාපනය කළද විගණිත අවස්ථාව වන විටද විදුලි සැපයුම ලබා දී නොතිබුණි. විදුලිය නොමැතිකම හේතුවෙන් රාත්‍රියේ ශාලාව තුළ ප්‍රසංග පැවැත්වීමට අපහසුතාවයක් ඇති බව නිරීක්ෂණය විය.	මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට භාර දෙනු ලැබේ.	ව්‍යාපෘතිය සම්පූර්ණ කර ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට භාර දීමට පියවර ගත යුතුය.

		(ii) ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ රජරට සේවයට පවරා දී ඇති ඉහත සඳහන් එළිමහන් රඟහල, 2024 දෙසැම්බර් 12 වන දින දක්වා අවස්ථා හතරකදී පමණක් ප්‍රසංග සඳහා ලබා දී ඇත. වැඩ කටයුතු වසරකට වැඩි කාලයකට පෙර අවසන් කර ඇතත්, රු. මිලියන 0.12 ක පමණ ආදායමක් පමණක් උපයා ඇති බැවින් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී තිබුණි.	වර්තමාන අවශ්‍යතාවයන්ට අනුකූලව SLBC විසින් කාර්යයන් නැවත සලකා බැලිය යුතු අතර මූල්‍ය ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා O&M සැලැස්ම සංශෝධනය කළ යුතුය.	ගොඩනැගිල්ල ආදායම් උත්පාදනය සඳහා යොදා ගැනීමට පියවර ගත යුතුය.
(ඇ)	ලංකාරාම රඟගාල ඉදිකිරීම	ගිවිසුමට අනුව කොන්ත්‍රාත්තුව 2022 අගෝස්තු 15 වන දින අවසන් කිරීමට නියමිතව තිබුණද, එය 2023 පෙබරවාරි 24 දක්වා දීර්ඝ කර තිබූ අතර, ව්‍යාපෘතිය ඇත්ත වශයෙන්ම 2023 මාර්තු 31 වන දින අවසන් කර තිබුණි. 2021 පෙබරවාරි 16 වන දින අනුරාධපුර මහ නගර සභාව සමඟ ඇති කරගත් අන්‍යෝන්‍ය ගිවිසුම මත පදනම්ව, 2023 අප්‍රේල් 6 වන දින ව්‍යාපෘතිය අනුරාධපුර මහ නගර සභාවට භාර දී තිබුණි.		
		(i) ව්‍යාපෘතිය ආරම්භයේදී ප්‍රදේශයේ වෙළෙන්දන් සඳහා සාප්පු ගොඩනැගිල්ලක් සහ රඟගාලක් ඉදිකිරීම සඳහා රු. මිලියන 67.21 ක ඇස්තමේන්තුගත වැඩ වටිනාකමක් හඳුනාගෙන තිබුණද, ඒ වෙනුවට රු. මිලියන 30.33 ක වටිනාකමකින් යුත් මල් සාප්පු සහ රඟගාලක් ඉදිකර තිබුණි. ඒ අනුව, ව්‍යාපෘතියේ ආරම්භක අදියරේදී හඳුනාගත් බොහෝ අයිතම අතහැර දමා නව අයිතම ඇතුළත් කිරීමෙන් මෙම රඟගාලේ ඉදිකිරීම් සිදු කර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකිරීම මෙම තත්ත්වයට හේතු වී තිබූ අතර ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීමට නොහැකි තිබුණි.	අදහස් ලැබී නොතිබුණි.	ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ගේ මූලික අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා ආරම්භක අදියරේදී පියවර ගත යුතුය.
		(ii) මෙම රඟගාල සම්බන්ධයෙන් අනුරාධපුර මහ නගර සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් නොගන්නා බවත්, ලංකාරාම විහාරාධිපති ස්වාමීන් වහන්සේ විසින් සාප්පු හිමියන්ගෙන් මසකට රු. 3000 බැගින් අයකර ගන්නා බවත් නිරීක්ෂණය විය. ඒ අනුව,	මෙම විශේෂිත රඟගාල දැනටමත් අනුරාධපුර මහ නගර සභාවට (AMC) භාර දී ඇත. රඟගාල	එකඟ වූ පරිදි කුලී ආදායම එකතු කිරීමට ක්‍රියාකල යුතුය.

			අනුරාධපුර මහ නගර සභාවට පවරා ඇති රථගාල ලංකාරාම විහාරස්ථානය විසින් කළමනාකරණය කරන බවත්, එය රජයට මූල්‍යමය පාඩුවක් බවත් විගණනයේදී නිරීක්ෂණය විය.	කළමනාකරණය කිරීම සඳහා අනුරාධපුර මහ නගර සභාව වගකිව යුතු අතර ඒ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	
		(iii)	සංවර්ධනය කරන ලද පරිශ්‍රයට විදුලිය සැපයීම සහ ELV පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා රු. මිලියන 5.95 ක පිරිවැයක් ඇස්තමේන්තු කර තිබුණද, මෙම කටයුතු සම්පූර්ණයෙන්ම නවතා දමා ලංකා විදුලිබල මණ්ඩලය හරහා විදුලිය සැපයීම වෙනුවට සෝලා විදුලි පහන් කණු සවි කර ඇති අතර වඳුරන් විසින් එම විදුලි පහන් කණු ද විනාශ කර ඇති බව නිරීක්ෂණය විය.	මෙම සෝලා විදුලි පහන් කණු තිරසාර විසඳුමක් ලෙස සවි කර ඇති අතර ආලෝකමත් කිරීම/විදුලිය වෙනුවෙන් වන රජයේ වියදම් නොසලකා හැරීමෙන් කළමනාකරණ පිරිවැය අඩුවේ.	විදුලිය ලබා දීමට ක්‍රියාකල යුතුයි.
		(iv)	මෙම ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද රු. මිලියන 30.33 ක පිරිවැය, අවශ්‍යතාවය නිසි ලෙස හඳුනා නොගැනීම සහ මූලික සැලසුම් සකස් නොකිරීම හේතුවෙන් ඌන උපයෝජනයට ලක්ව තිබුණි.	පිළිතුර ඉදිරියේදී ඉදිරිපත් කෙරේ.	පරිශ්‍රය ප්‍රයෝජනයට ගැනීමට ක්‍රියාකල යුතුය.
(ඇ)	දුම්රිය ප්ලාසා සංවර්ධන ව්‍යාපෘතිය.	(i)	සංවර්ධනය කරන ලද ප්‍රදේශයේ මීටර් 1800 ක් සඳහා එළිමහන් ලාම්පු සහ සොකට් රැහැන්ගත කිරීම සඳහා රු. මිලියන 2.37 ක මුදලක් වැය කර තිබුණු නමුත් පරිපථ ස්ථාපනයේ දෝෂ හේතුවෙන් පරිශ්‍රයට විදුලිය සැපයීමට නොහැකි වී තිබුණි. කොන්ත්‍රාත් ලේඛණයන්හි වෙළුම 06 ක්‍රම ප්‍රකාශය (Method statement) අනුව වරලත් විදුලි ඉංජිනේරුවකුගේ සේවය ලබාගත යුතු වුවද, ඉහත දෝෂ තත්ත්වයන් මත එවැනි අයගේ සේවයක් ලබාගෙන ඇති බව තහවුරු නොවේ. තවද, විදුලි ලාම්පු 337 ක් සවි කිරීම සඳහා රු. මිලියන 2.94 ක් වැය කර තිබුණද, විදුලි සැපයුම නොමැතිකම හේතුවෙන් එම වියදමද නිශ්කාර්ය වී තිබුණි.	සියලුම සංවර්ධන කටයුතු සුදුසුකම් ලත් වෘත්තිකයන්ගේ අධීක්ෂණය හරහා සිදු කරන ලද අතර දුම්රිය දෙපාර්තමේන්තුව දැනටමත් ඔවුන් සතුව ඇති පරිශ්‍රය ක්‍රියාත්මක කර කළමනාකරණය කළ යුතුය.	පරිශ්‍රයට විදුලිය සැපයීමට ක්‍රියාකල යුතුය.
		(ii)	ව්‍යාපෘතියෙහි විෂය පථයට අනුව දුම්රිය ප්ලාසා	දුම්රිය	පරිශ්‍රයට විදුලිය

		ව්‍යාපෘතියෙහි ප්‍රධාන කර්තව්‍යය වන්නේ එම ස්ථානයේ රැස්වන විශාල මගී ජනගහනයට සේවය කිරීම අරමුණු කරගත් රැස්වීම් අවකාශයක් සහ පොදු විවෘත අවකාශයක් ලබාදීමයි. තවද, වෙසක් සහ පොසොන් උත්සව සමයේදී මෙහි රැස්වන ජනගහනය සඳහා පොදු පහසුකම් සැපයීම මෙහි අරමුණ විය. කෙසේ වෙතත්, රු. මිලියන 45.68 ක වියදමින් ඉදිකරන ලද පරිශ්‍රය රාත්‍රියේදී අඳුරු ප්‍රදේශයක් ලෙස පවතින බවත්, අපේක්ෂා කළ පරිදි පොදු පහසුකම් සපයා නොමැතිකම හේතුවෙන් ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට නොහැකිව තිබුණු බවත් නිරීක්ෂණය විය.	දෙපාර්තමේන්තුව දැනටමත් ඔවුන් සතුව ඇති පරිශ්‍රය ක්‍රියාත්මක කර කළමනාකරණය කළ යුතුය.	ලබා දීමට සහ ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීමට ක්‍රියාකල ගත යුතුය.
(ඉ)	අනුරාධපුර ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතු වෙනුවෙන් උපදේශන සේවා ලබා ගැනීම	(i) 2021 නොවැම්බර් 24 වන දින පැකේජ 12 ක් යටතේ ප්‍රධාන ව්‍යාපෘති 06 ක් සඳහා විශේෂඥ කළමනාකරණ උපදේශන සේවා සැපයීම සඳහා ව්‍යාපෘතිය විසින් EGIS ජාත්‍යන්තර ආයතනය පත් කරන ලදී. ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා තවත් උප ව්‍යාපෘති 28 ක් හඳුනාගෙන තිබුණි. අනුරාධපුර ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇති පැකේජ 12 ක් යටතේ උප ව්‍යාපෘති 28 ක් සඳහා උපදේශන සේවා සැපයීම සඳහා EGIS ජාත්‍යන්තර ආයතනයට කොන්ත්‍රාත්තුව ලබා දී තිබූ බව නිරීක්ෂණය වූ අතර, ප්‍රධාන ව්‍යාපෘති 7 ක් යටතේ උප ව්‍යාපෘති 17 ක් ක්‍රියාත්මක කිරීමට උපදේශක ආයතනය අපොහොසත් වී තිබුණි. කොන්ත්‍රාත් මුදලින් සියයට 66 ක් එනම් රු.මිලියන 117.43 ක මුදලක් උපදේශක සමාගමට ගෙවා තිබුණද, සිංහ කණු වටරවුම, දුම්රිය ප්ලාසා, ශ්‍රී මහාබෝධි නැගෙනහිර ගේට්ටු රථගාල, එළිමහන් රංග ශාලාව ප්‍රතිසංස්කරණය සහ දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීමේදී උපදේශකවරයාගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී තිබුණි.	අදහස් ලැබී නොතිබුණි.	ව්‍යාපෘති කාල සීමාව තුළ ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය.

	(ii) දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා උපදේශන සේවා ලබා ගැනීම සඳහා ව්‍යාපෘතිය 2023 නොවැම්බර් 01 වන දින ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමඟ රු. මිලියන 7.8 ක කොන්ත්‍රාත් වටිනාකමකට ගිවිසුමකට එළඹ තිබුණි. 2024 අප්‍රේල් 09 වන දින ව්‍යාපෘති උපදේශක ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය පරිදි නව ව්‍යුහාත්මක, ජලනල හා යාන්ත්‍රික සැලසුම් සහ ඇදීම් සකස් කිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් අත්සන් කර ඇති බව නිරීක්ෂණය විය. එම ව්‍යාපෘතිය සඳහා නිර්මාණ සහ ඇඳීම් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යා නොහැකි වී තිබුණි.	අදහස් ලැබී නොතිබුණි.	ව්‍යාපෘතිය ප්‍රමාදයකින් තොරව ඉදිරියට ගෙන යාමට ක්‍රියාකල යුතුය.
(ඊ) වෙනත් නිරීක්ෂණ.	(i) මහාපරිමාණ සංවර්ධන ව්‍යාපෘති ප්‍රති-උපායගත කිරීම සහ වේගවත් කිරීම සඳහා වූ කමිටුවේ (RAMP) හි අනුමැතිය ලබා නොගෙන රු. මිලියන 236.85 ක වටිනාකමකින් යුත් විචලනයක් සිදු කර තිබුණි.	අදහස් ලැබී නොතිබුණි.	නිසි අනුමැතිය ලබා ගත යුතුය.
	(ii) 2022 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘති කාර්ය මණ්ඩල සංඛ්‍යාව අඩු කර ඇති අතර අර්ධකාලීන ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු සහ පූර්ණ කාලීන ප්‍රමාණ සමීක්ෂකවරයෙකු පමණක් ව්‍යාපෘතිය සමඟ සෘජුවම සම්බන්ධ වී තිබුණි. එපමණක් නොව, ව්‍යාපෘති කාලය තුළ ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කටයුතු සම්පූර්ණ කිරීමට ඇති හැකියාව විගණනයේදී සැක සහිතය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය ඵලදායී ආකාරයකින් නිම නොකර, 2016 වර්ෂයේ සිට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා රු. මිලියන 330 ක මුදලක් ගෙවා තිබුණි.	අදහස් ලැබී නොතිබුණි.	ව්‍යාපෘතියේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට ක්‍රියාකල යුතුය.

3.3 නිෂ්ක්‍රීය/ උපයෝජනය නොකළ/ ඌන උපයෝජිත සම්පත්

	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ ප්‍රතිචාරය	විගණකගේ නිර්දේශය
(අ)	උතුරු බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීම යටතේ වාරිමාර්ග නිල නිවාස ගොඩනැගිල්ල වෙනත් ස්ථානයකට රැගෙනයාම සඳහා වන්දි වශයෙන් රු.මිලියන 45.9 ක මුදලක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි. කෙසේ වෙතත්, මෙම පැකේජය අවලංගු කිරීමෙන් පසු එම මුදල වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් අයකර ගත යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එය අයකර ගෙන නොතිබුණි.	අදහස් ලැබී නොතිබුණි.	වන්දි අයකර ගැනීමට කටයුතු කළ යුතුයි.
(ආ)	2016 වර්ෂයේ ඇති කර ගත් ණය ගිවිසුමට අනුව රු. මිලියන 8,354.32 ක අරමුදල් ලබා දීමට ණය නියෝජිතායතනය එකඟ වී තිබූ අතර භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.මිලියන 1,670.86 ක් විය. ණය කාලසීමාව 2023 සැප්තැම්බර් 30 දින අවසන්වී තිබුණු අතර 2024 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 2,754.08 ක් හෙවත් සියයට 27.47 ක් පමණක් උපයෝජනය කර තිබුණි. මේ හේතුවෙන් අනුරාධපුර පූජා නගර සංවර්ධන ව්‍යාපෘතියේ පැකේජ 12 කින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි විය.	ව්‍යාපෘතිය හරහා සිදුවන බාහිර හා අභ්‍යන්තර ඇහවුම් මඟහරවා ගැනීමට සහ අපේක්ෂිත ව්‍යාපෘති අරමුණු වලට පටහැනි විය හැකි අනවශ්‍ය ප්‍රමාදයන්, අනුපිටපත් කිරීම් සහ අනවශ්‍ය ක්‍රියාකාරකම් වළක්වා ගැනීමට අමාත්‍යාංශය සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) උපරිම උත්සාහයක් ගෙන ඇත.	සැලසුම් කළ පරිදි අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගත යුතුය.
(ඇ)	පැකේජ 01 යටතේ දුම්රිය ප්ලාසා සංවර්ධන ව්‍යාපෘතිය රු. මිලියන 98 ක වටිනාකමකින් නිම කර 2022 වර්ෂයේ දී දුම්රිය දෙපාර්තමේන්තුවට භාර දී ඇත. කෙසේ වෙතත්, අලුතින් ඉදිකරන ලද ආපනශාලාව 2024 දෙසැම්බර් 31 වන දින දක්වා නිසි නඩත්තුවක් නොමැතිකම හේතුවෙන් හිස්ව පැවතුණි. එබැවින්	අදහස් ලැබී නොතිබුණි.	ගොඩනැගිල්ල ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතුකල යුතුය.

	දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ දීර්ඝ කාලීන මෙහෙයුම් සහ නඩත්තු ගිවිසුමක් ඇති කර නොගැනීමෙන් දුම්රිය ප්ලාසා ගොඩනැගිල්ල අක්‍රියව පැවති බව නිරීක්ෂණය විය		
(ඇ)	කොන්ත්‍රාත්කරු විසින් කම්කරුවන් සහ යන්ත්‍ර සූත්‍රවල අක්‍රියභාවය සහ ආනුෂංගික වියදම් සඳහා අත්හිටුවීමේ හිමිකම් ලෙස රු.මිලියන 115 ක් ද, කාලය දීර්ඝ කිරීම සඳහා රු. මිලියන 69.93 ක මුදලක් ද ඉල්ලා ඇති අතර, එම පිරිවැය ව්‍යාපෘතිය අත්හිටුවීම හේතුවෙන් ව්‍යාපෘති පිරිවැයට බරක් විය.	අදහස් ලැබී නොතිබුණි.	අමතර වියදම් වළක්වා ගැනීමට පියවර ගත යුතුය.
(ඉ)	ව්‍යාපෘතිය අත්හිටුවීම හේතුවෙන් කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු. මිලියන 1,176 සිට රු. මිලියන 1,795 දක්වා සියයට 53 කින් වැඩිවී තිබුණු අතර එය සෘජුවම ශ්‍රී ලංකා රජයේ අරමුදලට බරක් වනු ඇත.	අදහස් ලැබී නොතිබුණි.	අමතර වියදම් වළක්වා ගැනීමට කටයුතුකල යුතුය

3.4 පද්ධති සහ පාලන

විගණන නිරීක්ෂණය	**කළමනාකරණයේ ප්‍රතිචාරය**	**විගණකගේ නිර්දේශය**
වත්කම් හිමියන්ට පවරා දුන් ව්‍යාපෘති වත්කම්වල දිගුකාලීන තිරසාරභාවය සඳහා නිශ්චිත වත්කම් කළමනාකරණ සැලැස්මක් ව්‍යාපෘතිය විසින් සකස් කර නොතිබුණි.	අදහස් ලැබී නොතිබුණි.	වත්කම් කළමනාකරණ සැලැස්ම සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය.